# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 අප්‍රේල් / මැයි**

**සමාජීය විද්‍යා පීඨය**

**සමාජ විද්‍යාව - SOCI - E 1015**

**සමාජ විද්‍යාවේ මූලික සංකල්ප**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "සමාජය යනු අන්තර් සබඳතා ජාලයකි. එය නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතී." මේ පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක් කරන්න.

02. සමාජ විද්‍යාව හා සමාජ මානව විද්‍යාව අතර තිබෙන වෙනස්කම් ඒ හා සම්බන්ධ සමාජ හා සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයන් නිදර්ශන ලෙස පෙන්වමින් සාකච්ඡා කරන්න.

03. "දූස්-සමාජානුයෝජනය බිඳුණු පවුලක ප්‍රතිඵලයකි."සමාජානුයෝජන කාරකයක් ලෙස මානව පවුලේ කාර්යභාරය සැළකිල්ලට ගනිමින් ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද? හේතු දක්වන්න.

04. මැක්ස් වෙබර්ගේ (Max Weber) සමාජ විග්‍රහය තුළ සමාජ ක්‍රියා (Social action) පිළිබඳ න්‍යාය වැදගත් වන්නේ ඇයිදැයි නිදසුන් සහිතව පෙන්වන්න.

05. සමාජයක ආර්ථික හැසිරීම සහ ආගමික හැසිරීම අතර තිබෙන අඛණ්ඩ සබඳතාව ඔබ විග්‍රහ කරන්නේ කෙසේද?

06. "පංති ස්ථරායනය නූතන සමාජයන්හි ප්‍රධාන අංගයකි." මේ පිළිබඳ කාල් මාක්ස්ගේ (Karl Marx) සමාජ විග්‍රහය සමඟ තර්කානුකූල විග්‍රහයක යෙදෙන්න.

07. "නිලබලවාදය තාර්කික සමාජයක පරමාදර්ශී පරිපාලන ක්‍රමයයි." මෙම ප්‍රකාශය හා ඔබ කෙතරම් දුරට එකඟ වන්නේදැයි විමසන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> පිළිබඳ සටහන් ලියන්න.

    1. සමාන්තර හා හරස් ඥාතීන්
    2. එමිල් ඩර්කයිම්
    3. සමාජ පාලන උපක්‍රම
    4. ප්‍රාථමික හා ද්විතික සමූහ

****************************

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

සමාජීය විද්‍යා පීඨය

සමාජ විද්‍යාව - SOCI - E 1025

ප්‍රායෝගික සමාජ විද්‍යාව

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සාමාන්‍ය සමාජ විද්‍යාව හා ප්‍රායෝගික සමාජ විද්‍යාව අතර ඇති සම්බන්ධතාව සාකච්ඡා කරන්න.

02. ප්‍රායෝගික සමාජ විද්‍යාවේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරන්න.

03. විධිමත් සැලසුමෙන් තොරව සංවර්ධනය ළඟා කර ගත නොහැකිය. විමසන්න.

04. ශ්‍රී ලංකාව පිළිබඳ අවධාරණය කරමින් නවීකරණයේදී ඇතිවන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන්න.

05. ජනවාර්ගික අර්බුදයේ සමාජ හා සංස්කෘතික සාධක විමසන්න.

06. ප්‍රජා සංවර්ධනයේදී සමාජ සුභසාධන කටයුතුවල දායකත්වය පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාවේ ඕනෑම සමාජ ප්‍රශ්නයක් පිළිබඳ විමසීමක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා <u>දෙකකට (02)</u> සටහන් ලියන්න.

1. නාගරීකරණය
2. විද්‍යාත්මක ක්‍රමය
3. සංස්කෘතික ගැටුම
4. බටහිරකරණය
5. සමාජ වැඩ

**************************